සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

43 S I

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

**Second Term Test - Grade 12 - 2018**

විභාග අංකය .............................

# ක්‍රිස්තු ධර්මය I

කාලය පැය දෙකයි

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයකට 1,2,3,4,5 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ලකුණු කරන්න.**

01. 'දෙවියන් වහන්සේ ශු.බයිබලයට තුළින් හැඩගස්වන්නේ, හා පුහුණු කරන්නේ කිතුනුවන් මිස ගණිතඥයන් නොවේ.' මෙලෙස පවසා ඇත්තේ,
    - i. ශු. ක්ලෙමන්ට් තුමා
    - ii. ශු. ජෙරොම්තුමා
    - iii. ශු. අගුස්තීනු තුමා
    - iv. ශු. බැසිල් තුමා
    - v. ශු. ටර්ටූලියන් තුමා

02. හෙබ්‍රෙව් 1,1- 2 හි සඳහන් වනුයේ,
    - i. ක්‍රිස්තුන් වහන්සේගේ දෙවන ආගමනයයි.
    - ii. අවසාන අනාවරණය ක්‍රිස්තුන් වහන්සේ බවයි.
    - iii. දේව අනුග්‍රහය ව්‍යවස්ථාව අභිබවා යන බවයි
    - iv. ඇදහිල්ල තුල ගැළවීම ලැබෙන බවයි.
    - v. නව ආදම්, නව ලෝකය අතර ඇති සබඳතාවයයි.

03. ප්‍රාග් ඉතිහාසය සම්පාදනය වීමෙහිලා දායක වී ඇති සම්ප්‍රදායන් වන්නේ,

    i. P හා J ය. ii. E හා J ය. iii. D හා P ය. iv. J හා D ය. v. E හා P ය.

04. පුරාණ බටහිර ආසියාවේ මුල්ම කර්මාන්තය වූයේ,

    i. කෘෂි කර්මාන්තය ii. කුඹල් කර්මාන්තය iii. එඬේර වෘත්තිය

    iv. ගොඩනැගිලි කර්මාන්තය v. වාරි කර්මාන්තය

05. 'මිනිසුන් අතරින් නුඹ පමණක් මා ඉදිරියේ දැහැමි බව මම දුටිමි.' සමිදාණන් වහන්සේ මෙසේ පවසන ලද්දේ.

    i. නෝවාටය ii. ආබ්‍රහම්ටය. iii. ආදම්ටය iv. ජාකොබ්ටය v. ආබෙල්ටය.

06. සාදාචාරයේ ආධිපත්‍ය ලබා ගැනීමට මිනිසා ගත් උත්සාහය ව්‍යවර්ථ වූ බව දක්වන කතා පුවත වන්නේ,

i. බාබෙල්කොත ii. නෝවා හා ජල ගැල්ම iii. කායින් හා ආබෙල්

iv. ආදම් හා ඒව පව් කිරීම. v. කායින් වෙනුවට ලාමෙක් පැමිණීම.

07. ආදි පිතෘ යුගය ලෙස සලකනු ලබන්නේ,

i. ක්‍රි.ව. 2000 - 1700 අතර ii. ක්‍රි.පූ. 1800 - 1900 අතර iii. ක්‍රි.ව. 2000 - 1800 අතර

iv. ක්‍රි.ව. 1800 - 1900 අතර v. ක්‍රි.පූ. 2000 - 1700 අතර

08. මිනිසා පාපයට වැටීමේ කතා පුවත රචනා වී ඇති සම්ප්‍රදාය වන්නේ,

i. යාවේ සම්ප්‍රදාය ii. එලොහිම් සම්ප්‍රදාය iii. ද්විතීය නීති සම්ප්‍රදාය

iv. පූජක සම්ප්‍රදාය v. වාචික සම්ප්‍රදාය

09. පුරාණ ගිවිසුමේ නව මැවිල්ලේ ආරම්භකයා වන්නේ,

i. ආබ්‍රහම් ii. සෙත් iii. ආබෙල් iv. මෝසෙස් v. නෝවා

10. 'දෙවියන් වහන්සේගේ ගෘහය' යන අර්ථය ඇති ස්ථානය වන්නේ,

i. බබිලෝනිය ii. බෙතෙල් iii. හෙබ්‍රොන් iv. කානාන් v. බෙයර්ෂෙබා

11. පොළෝ තලය මත විවිධ ජාතීන් වශයෙන් ජන කොටස් විසිර ගිය සැටිත්, ඔවුන්ට වෙන්වූ භාෂාවන් හැඩ ගැසුණු සැටිත් විස්තර කිරීමට ගෙතූ .......................... ලෙස බාබෙල් කොත හඳුනාගෙන හැකිය. මෙහි හිස්තැනට සුදුසු පිළිතුර වන්නේ,

i. උපමාවක් ii. රූපකයක් iii. කතන්දරයක් iv. සාගාවක් v. උපකල්පනයක්

12. පාපය නිසා දෙවියන් වහන්සේ ශෝක වන බව දැක්වීමෙන් ජල ගැල්ම පිළිබඳ කතාවෙහි බයිබල් කතුවරයා අදහස් කර ඇත්තේ,

i. දෙවියන්ට පවා ශෝකය දැනෙන බව පෙන්වීම.

ii. දෙවියන් ශෝක වේ නම් අපටද ශෝකය උරුම බව පෙන්වීම.

iii. දෙවියන් වහන්සේව මනුෂ්‍ය ආකාරයෙන් දැක ඇති බව පෙන්වීම.

iv. දෙවියන්ට ශෝකය ඉවත ලිය නොහැකි බව පෙන්වීම.

v. ලෝකය සහමුලින්ම වනසාලීමට දෙවියන් තීරණය කළ බව පෙන්වීම.

13. ' හුස්ම හෙවත් හුළං පොද' යන අරුත් ගැන්වෙන නාමය හිමි පුද්ගලයා වන්නේ,

i. ආදම් ii. සෙත් iii. නෝවා iv. කායින් v. ආබෙල්

14. (උත්පත්ති 3:15) මෙම පාඨය 'ප්‍රාථමික සුවිශේෂය' Proto - evangelion නමින් හඳුන්වා ඇත්තේ,

i. ශු. අයිරේනියස් තුමාය ii. ශු. අගුස්තීනු තුමාය iii. ශු. ජෙරොම්තුමාය

iv. ශු. ජස්ටින් තුමාය v. ශු. ක්ලෙමන්ට් තුමාය

15. ගැලවීමේ ඉතිහාසයේ මුල් යුගයේ දෙවියන් වහන්සේ විසින් තෝරා ගන්නා ලද පුද්ගලයන් හඳුන්වනු ලබනුයේ,

i. වීරවරුන් ලෙසය. ii. ආදිපීතෘවරුන් ලෙසය iii. දිවැසිවරුන් ලෙසය

iv. පූජකයන් ලෙසය v. රජවරුන් ලෙසය

16. ජෙරබෝවම් රජ රන් වස්සන් ස්ථාපිත කර ගොඩනැගූ වන්දනා ස්ථාන වනුයේ,

i. ගලීලය, සමාරියාව   ii. එම්මාවුස්, හෙබ්‍රොන්   iii. පීතොම්, රාමසෙස්

iv. බෙතෙල්, දාන්   v. නාසරෙත්, ජෙරුසලම

17. ගිවිසුමේ බාහිර සලකුණක් මෙන්ම ප්‍රසාද ස්නාපනයේ පෙර සලකුණක් ලෙස සැලකෙන්නේ,

i. තෙලයෙන් අභිෂේක කිරීමය.

ii. සතුන්ගේ ලේ පූජාසනය මත ඉසීමය.

iii. චර්මඡේදනය කිරීමය.

iv. දේව මාළිගාවේ කැප කිරීමය.

v. දසයෙන් කොටස ගෙවීමය.

18. ඊසාක් ක්‍රිස්තුන් වහන්සේගේ පූර්ව සළකුණක් වනුයේ,

i. ඔහු ආබ්‍රහම්ගේ පුත්‍රයා වීමය.

ii. ඔහු දේශයේ උරුමකරු වීමය.

iii. ඔහු පූජාවීම පිළිබඳ කිසිවක් නොදත් නිසාය.

iv. ඔහු අවංක, කීකරු කෙනෙකු වීම නිසාය.

v. ඔහු නිර්දෝශී වූවත් ජීවිත පූජාවකට ගෙන යාම නිසාය.

19. 'අෂේරා යන්නෙහි අර්ථය වන්නේ,

i. දෙවඟන යන්නයි.

ii. බාල්ගේ බිරිඳ යන්නයි.

iii. දේවාල වෛශ්‍යාකර්මය යන්නයි.

iv. සර්පයා යන්නයි.

v. කාමුක චාරිත්‍ර යන්නයි.

20. මැවීමේ පළමු කතාවට අනුව 05 වන දින දෙවියන් වහන්සේ මවන ලද්දේ

i. ගොඩබිම හා සතුන්ය

ii. උරගයින් හා පක්ෂීන්ය.

iii. අහස හා පොළවය.

iv. ආලෝකය හා අඳුරය.

v. ආකාශ පක්ෂීන් හා ජලයේ මත්ස්‍යයන්ය.

21. උතුරු, දකුණු රාජ්‍ය බෙදී යාමෙන් පසු එම රාජ්‍ය දෙක හැඳින්වූයේ

i. උතුර - ඉශ්රායෙලය / දකුණ - ජුදා

ii. උතුර - ජෙරුසලම / දකුණ - බෙතෙල්

iii. උතුර - සමාරියාව / දකුණ - අසිරියාව

iv. උතුර - ෂෙකෙම් / දකුණ - ජුදා

v. උතුර - පර්සියාව / දකුණ - සමාරිය

22. බොහෝ දෙනෙකුගේ පිළිගැනීම අනුව ජෝසප් ගැන කිසිවක් නොදත් 19 වන පාරාවෝ රජපරම්පරාවේ රජතුමා වන්නේ,

i. මහ හෙරෝද් ii. පාරාවෝ iii. සයිරස්

iv. II රාමසෙස් v. නෙබුකද්නසාර්

23. මෝසෙස් විවාහ කරගත් නැතැත්තිය වන්නේ,

i. ලෙයා ii. රාකෙල් iii. බැත්ශෙබා

iv. රෙබෙකා v. ශිප්පොරා

24. දෙවියන් වහන්සේ තෝරාගත් ජනතාවගේ ආරම්භය පදනම් වූයේ,

i. ආදම්ගේ පාපයත් ලැබූ දඬුවමත් මතය

ii. ආබ්‍රහම්තුමාගේ කැඳවීමත් විශ්වාසයත් මතය.

iii. මෝසෙස් තුමාගේ කැඳවීමත් අභියෝගත් මතය.

iv. ඊසාක්ගේ උපතත් දේශය උරුම කර ගැනීමට ගත් පියවර මතය.

v. ජාකොබ් ලබාගත් කුළුදුල් කමත් මිනිස් දුබලතාවයත් මතය.

25. දෙවියන් වහන්සේ මිනිසා සමග කළ ගිවිසුම් අතරින් තෙවෙනි ගිවිසුම ඇති කර ගත් පුද්ගලයා වන්නේ,

i. ආදම්ය. ii. මෝසෙස්ය. iii. නෝවාය.

iv. ඊසාක්ය. v. ආබ්‍රහම්ය.

26. කලහ කිරීම / විවාද කිරීම යන අරුත ඇති ස්ථානය නම් කර ඇත්තේ,

i. බෙතෙල් ii. මස්සා iii. මෙරීබා

iv. දාන් v. බෙයර්ෂෙබා

27. පුරාණ පෙරදිග ලෝකයේ පැවැති ගිවිසුම් වල ලක්ෂණයකි.

i. කොන්දේසි සහිතව ගිවිසුම ස්ථාපිත කිරීම.

ii. කොන්දේසි සුරැකීම පිණිස දෙවි කෙනකු සාක්ෂි දැරීම.

iii. දෙපාර්ශවයෙන්ම සාක්ෂිකරුවන් ඉදිරිපත් කිරීම.

iv. දෙපළු කරන ලද සිවුපා සතෙකු යොදා ගැනීම.

v. ද්වි පාර්ශ්වික එකඟතාව ගැන අවධානය යොමු කිරීම.

28. දෙවියන් වහන්සේ හා මිනිසා අතර ඇතිවන ගිවිසුම් වල දැකිය විශේෂ ලක්ෂණයකි.

i. ගිවිසුමට මුල පුරන්නේ දෙවියන් වහන්සේ වීම.

ii. දෙව් මිනිස් සබඳතාවය ප්‍රකාශ වීම.

iii. මිනිසා දුබල බැවින් දෙවියන් සම්බන්ධ වීම.

iv. මිනිසා දෙවියන්ට පිටුපා කටයුතු කිරීම.

v. දෙවියන් වහන්සේ මිනිසාට අනතුරු ඇඟවීම.

29. එඬේරික ජනතාවක් ලෙස දිවි ගෙවූ ඉශ්රායෙල් ජනයා සුවිශේෂී දේව ජනතාවක් බවට පත්වූයේ,

i. චර්මඡේදනය තුළිනි. ii. බව්තිස්මය තුළිනි. iii. කල්වාරි ගිවිසුම තුළිනි.
iv. සීනයි ගිවිසුම තුළිනි. v. නික්මයාම තුළිනි.

30. දෙවියන් වහන්සේ හා නෝවා අතර ඇති වූ ගිවිසුමේ බාහිර සලකුණ වනුයේ,

i. චර්මඡේදය ii. ඝන වළාකුල iii. දේදුන්න
iv. ගිනිටැඹ v. දස පනත

31. දස පණත අඩංගු වන ශු. බයිබලයේ කෘති දෙක වනුයේ,

i. උත්පත්ති - ගීතාවලිය
ii. නික්මයාම - ගණන් කතාව
iii. නික්මයාව - ලෙවී ව්‍යවස්ථාව
iv. ද්විතීය නීති සංග්‍රහය - නික්මයාම
v. උත්පත්ති - ගණන් කතාව

32. සීනයි ගිවිසුමේ හරය ගැබ්වී ඇත්තේ ........... තුළය මෙහි හිස්තැනට යෝග්‍ය පිළිතුර වන්නේ,

i. දස පණත ii. ව්‍යවස්ථාවලිය iii. ඇදහිල්ල
iv. ශුද්ධ ලියවිල්ල v. දේව ජනතාව

33. දාවිත් රජු විසින් දේශපාලනික හා ආගමික වශයෙන් වැදගත් තැනක් ලබාදුන් හා, තම අගනුවර බවට පත්කර ගත් නගරය වන්නේ,

i. බෙත්ලෙහෙම ii. ජෙරුසලම iii. කානා
iv. නාසරෙත් v. ගලීලය

34. 'එම්මානුවෙල්' යන නාමයෙන් අරුත් ගැන්වූයේ

i. ආලේපලත් තැනැත්තා
ii. අභිෂේකලත් තැනැත්තා
iii. සම්දාණෝ එඬේරාණෝය
iv. දෙවියන් වහන්සේ ආලේප කරන සේක
v. ස්වාමීන් වහන්සේ අප සමඟය.

35. ලේඛක දේවානුභාවය සඳහා නිදසුනක් ලෙස දැක්විය හැකි උපුටනය වන්නේ,

i. නුඹලාගේ මුවෙහි තබන මාගේ වචන පහ නොවන්නේ ය. (යෙසායා 59, 21)
ii. මනුෂ්‍යයෝ ශුද්ධාත්මානුභාවයෙන් පොළඹවනු ලැබ දෙවියන් වහන්සේගේ වචනය කථා කළහ. ( 2 පේදුරු 1,21)
iii. එවිට සාමුවෙල් තෙල් කුලාව රැගෙන ඒ තැනැත්තා ඔහුගේ සහෝදරයන් ඉදිරියේ අභිෂේක කළේය. (1 සාමුවෙල් 16,13)
iv. එවිට මෝසෙස් මේ නීතියේ අඩංගු කරුණු සියල්ලම කෙළවර වන තෙක් පොතක ලීවේය. (ද්විතීය 31, 24)
v. ශුද්ධාත්මානුභාවය ඔහුට දුන් තැනැන් වහන්සේ කොහේද? (යෙසායා 63,11)

36. ජාකොබ් තුමා 'ඉශ්‍රායෙල් ' ලෙස හැදින්වූයේ,

i. ජෝෂප්ගේ උපතින් පසුවය.

ii. ඒසව් සමඟ සමගි වූ විටය.

iii. අද්භූත මනුෂ්‍යයකු සමඟ පොර බැඳීමෙන් පසුවය.

iv. එතුමාගේ උපතේදීමය.

v. මිසරයේදී නැවත ජෝශප් මුණ ගැසීමෙන් පසුවය

37. ජනතාව පීඩනයට පත් කරන අසාධාරණය දේව උදහසට ලක්වන බව නිර්භීතව පෙන්වා දුන් දිවැසිවරයා වන්නේ,

i. යෙසායා ii. ජෙරමියා iii. හොසියා iv. ආමොස් v. එසකියෙල්

38. නාතාන් දිවැසිවරයා විසින් දාවිත් රජුට ඉදිරිපත් කල මෙසියානික අනාවැකිය වන්නේ,

i. දෙවියන් වහන්සේ අප සමඟ බවය.

ii. එතුමන්ගේ රාජ්‍ය සදාතනික බවය.

iii. උන්වහන්සේගේ රාජ්‍ය අල්ෆා හා ඔමේගා බවය.

iv. උන්වහන්සේ සියල්ල අභිබවා වැඩ සිටින බවය.

v. එතුමාණෝ අධර්මිෂ්ඨයින්ට දඬුවම් කරන බවය.

39. සීනයි ගිවිසුම ස්ථිර කිරීමේ දෙවන අදියරට ඇතුළත් වනුයේ,

i. ආඥා නියෝග සෙනඟට දැන්වීම හා නුමුහුන් දූප අනුභවය.

ii. නුමුහුන් පූප අනුභවය හා තිත්ත පලා අනුභවය

iii. කන්දෙන් බැහැරව සිටීම හා ආඥා නියෝග සෙනඟට දැනුම් දීම.

iv. ආඥා නියෝග සෙනඟට දැන්වීම හා තිත්ත පලා අනුභවය.

v. ලෙයින් කොටසක් පූජාසනය මත ඉසීම හා සෙනඟ ප්‍රතිඥා දුන් පසු රුධිරය ජනතාවට ඉසීම.

40. ශුද්ධ බයිබලයේ සඳහන් වන විවිධ දර්ශන අතරින් දිවැසිවර යෙසායා දුටු දර්ශනය වන්නේ,

i. තේජාන්විත දේව දර්ශනය ii. ස්වර්ගීය ඉණිමග iii. අද්භූත සත්ත්වයන්

iv. අත්තික්කා කුඩ දෙක v. වියළි ඇටකටු මිටියාවත

41. ජුදා සිරිත අනුව වසරේ පළමු මාසයේ 14 දින සිදුකරන මංගල්‍ය වන්නේ,

i. සති මංගල්‍යය

ii. කූඩාරම් මංගල්‍යය

iii. පාස්කු මංගල්‍යය

iv. නත්තල් මංගල්‍යය

v. පෙන්තකොස්ත මංගල්‍ය

42. පුරුෂයා හා ස්ත්‍රිය අතර ඇති සම්බන්ධතාවය විදහා දැක්වෙන වචන ද්විත්වය වන්නේ,

i. ඉෂ් - ඉස්ෂාහ් ii. රාදා - ආෆාර් iii. ආදම් - අදමාහ්

iv. අබාද් - ෂමාර් v. ඒසෙර් - නෙකොබා

43. පොදු පිළිගැනීම අනුව ගීතාවලියට පදනම් වී ඇත්තේ.

   i. තෝරාගත් ජනයාගේ විමුක්තියයි.

   ii. මෙසියානික ආගමනයයි.

   iii. ඉශ්‍රායෙලයේ ජනවන්දනාවයි.

   iv. දේව අනාවරණය ලැබූවන්ගේ අත්දැකීම්ය.

   v. යහපත් ජීවිතයක් ගත කිරීමට අවැසි උපදෙස්ය.

44. වෙනත් දෙවිවරුන්ට වන්දනා කිරීමේ පාපය දිවැසිවර හොසියා විසින් හඳුන්වනු ලබන්නේ,

   i. විප්‍රවාසයක් ලෙසිනි.

   ii. වෛශ්‍යාකමක් ලෙසිනි.

   iii. රටක් යටත් කරගැනීමක් ලෙසිනි.

   iv. පියාගෙන් ඈත්වීම ලෙසිනි.

   v. අකීකරුකමක් ලෙසිනි.

45. දිවැසිවර යෙසයාගේ දූත මෙහෙය සම්බන්ධ කාලයට අයත් ජුදයාවේ රජකම් කළ රජවරුන් තිදෙනා මෙහෙය වන්නේ,

   i. ජොෂියා, ජෙහොයාකිම්, ශෙදකියා

   ii. නෙබුකද්නේශර් ජෙහොයාකින්, සයිරස්

   iii. දාවිත්, සලමොන්, ජෙරබෝවම්

   iv. ජෝතාම්. ආහාස්, හෙසකියා

   v. රෙශීන්, රොහෙබෝවම්, සාවුල්

46. ඉශ්රායෙල්හි ප්‍රඥාව යනුවෙන් අදහස් කරනුයේ,

   i. රාජ්‍යයක් පාලනය කිරීමේ දැනුම

   ii. රාජ්‍යයන් යටත් කර ගැනීමේ හැකියාව

   iii. යහපත් ලෙස ප්‍රගුණ කළ චර්යාව.

   iv. හැම විෂය ක්ෂේත්‍රයක්ම අධ්‍යයනය කිරීම

   v. දෙවියන් හඳුනා ගැනීම, සියල්ලට වඩා උන්වහන්සේට ප්‍රේම කිරීම.

47. ශුභාරංචියක් ලෙස හැඳින්විය හැකිවන්නේ,

   i. ජේසුස් වහන්සේගේ ප්‍රසිද්ධ ජීවිතය අළලා ලියන ලද කෘතියකි.

   ii. ජේසුස් වහන්ගේ ජීවිතයේ තෝරාගත් සිද්ධි කීපයක් ඇසුරින් ලියූ දේවාධර්මික කෘතියකි.

   iii. ජේසුස් වහන්සේ පිළිබඳ චරිතාපදානයකි.

   iv. ජේසුස් වහන්ගේ උපතේ සිට මරණය දක්වා වූ සිදු වූ සිදුවීම් පිළිබඳ හැඳින්වීමකි.

48. අති උතුම් 13 වන ලියෝ ශුද්ධෝත්තම පියතුමන්, ශුද්ධ බයිබලයයේ ප්‍රධාන කතෘ දෙවියන් වහන්සේ බව සඳහන් කරමින් ලියන ලද විශ්ව ලේඛනය වන්නේ,

i. දිව්‍ය සංරක්ෂණය
ii. වෙහෙසෙන මිනිස්සු
iii. දෙවියන් වහන්සේ ප්‍රේමයය
iv. අප සමඟ නතර වුව මැනව ස්වාමිනි
v. ලෝක සාමය

49. පහත තොරතුරු අතරින් මෝසෙස් තුමා පිළිබඳ සාවද්‍ය තොරතුරක් වන්නේ,

i. පියා අම්රාන්ය.
ii. සහෝදරයා ආරොන්ය.
iii. ලෙවී ගෝත්‍රයට අයත්ය.
iv. සහෝදරිය මීකල්ය.
v. මව ජොකෙබෙද්ය.

50. ගීතාවලිය සම්බන්ධයෙන් ගැඹුරු අධ්‍යයනයක් ප්‍රථම වරට කරන ලද්දේ

i. වෙල් හවුසන් විසිනි
ii. කාල් රානර් විසිනි
iii. ජෝන් වෙස්ලි විසිනි
iv. කාල් ෆික්ස් විසිනි.
v. හර්මන් ගුන්කල් විසිනි.

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education NWP

43 | S | I

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

Second Term Test - Grade 12 - 2018

විභාග අංකය .............................

# ක්‍රිස්තු ධර්මය II

කාලය පැය තුනයි

වැදගත්

I කොටසින් ප්‍රශ්න දෙකක් ද II කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරා ගෙන ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.

## I කොටස

01. i. ආදිපිතෘවරුන් මගින් ජනතාවට වූ සේවය පිළිබඳ කරුණු හතරක් නම් කරන්න.
    ii. පාස්කු ජනවන්දනාවේ සිදුකළ ප්‍රධාන අංග හතරක් නම් කරන්න.
    iii. දස පණතෙහි ලක්ෂණ හතරක් නම් කරන්න.
    iv. දිවැසිවර කැඳවීමේ ව්‍යුහයට ආවේණික පළමු ලක්ෂණ හතරක් පිළිවෙළින් නම් කරන්න.
    v. ප්‍රඥා සාහිත්‍යයට අයත් පොත් හතරක් නම් කරන්න. (ලකුණු 4 x 5 = 20)

02. i. පුත්‍රයන් දොළොස් දෙකනුගේ පියාවුවත් ඒ අතරින් ජාකොබ් ජෝසප්ට ඇලුම්වීමට හේතු හතරක් නම් කරන්න.
    ii. ජොහනීය දේහයට අයත් කෘති හතරක් නම් කරන්න.
    iii. 'මන්නා' පිළිබඳ කරුණු හතරක් ලියන්න.
    iv. දිවැසිවර යෙසායා සඳහන් කරන පරිදි මෙසියස් වහන්සේගේ සුලක්ෂණ හතරක් නම් කරන්න.
    v. ගීතාවලියෙහි තෙහිලි ගීත වර්ගීකරණය කර ඇති ප්‍රභේද හතරක් නම් කරන්න. (ලකුණු 4 x 5 = 20)

03. i. කාන්තාර ගමනේදී ඉශ්රායෙල් ජනතාව කෙදිරි ගෑමේ ප්‍රධාන අවස්ථා හතරක් නම් කරන්න.
    ii. පැරණි දිවැසිවරුන් හතරක් නම් කරන්න.
    iii. දිවැසිවර යෙසායාට අනුව දාවිත් රජ පෙළපතේ රාජාංකුරය වන මෙසියස් වහන්සේට ආත්මානුභාවය ලැබීමෙන් ඇතිවන ප්‍රතිඵල හතරක් නම් කරන්න.
    iv. හෙබ්‍රෙව් ප්‍රඥාවේ ප්‍රභේද හතරක් නම් කරන්න.
    v. ඉශ්රායෙල්හි ප්‍රඥාව ඉදිරිපත් කර ඇති සාහිත්‍යම ස්වරූප හතරක් නම් කරන්න.
    (ලකුණු 4 x 5 = 20)

## II කොටස

04\. i. මෝසෙස් තුමා අග්‍රහණයේ දිවැසිවරයෙකි. පුරාණ ගිවිසුමේ දිවැසිවර කැඳවීමේ ලක්ෂණ පසුබිම් කරගෙන මෝසෙස්තුමා ලද කැඳවීම පිළිබඳ වචන සියයකින් පමණ විස්තර කරන්න.

ii. අභියෝගාත්මක වත්මන් සමාජය හමුවේ කිතුනු ඔබේ දිවැසිවර කාර්යය කරුණු පහක් යටතේ පැහැදිලි කරන්න.

(ලකුණු 10 x 2 = 20)

05\. i. මිනිසාගේ වැටීම කරණකොටගෙන මිනිස් දුක් දොම්නස් සියල්ල පාපයේ විපාක ලෙස බයිබල් කතුවරයා ඉදිරිපත් කර ඇති අයුරු කරුණු පහක් ඇසුරින් පැහැදිලි කරන්න.

ii. ප්‍රාගේ ඉතිහාසය පුරාම මිනිසා උත්සාහ කර ඇත්තේ දේව අභිමතය ඉක්මවා යාමටය. විමසන්න. (වචන සියයක් පමණ සෑහේ) (ලකුණු 10 x 2 = 20)

06\. i. දිවැසිවර ඉගැන්වීම ප්‍රධාන තේමා තුනකි . එම තේමා තුන පැහැදිලි කරන්න. (වචන සියයක් පමණ සෑහේ)

ii. බහුදේවවාදී බලපෑම් මධ්‍යයේ ජීවත්වන ඔබේ මිතුරෙකුට එකම දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය ඇති කිරීමට ඔබ ගන්නා ක්‍රියාමාර්ග කරුණු පහක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 10 x 2 = 20)

07\. i. නික්මයාම ගමන තුළ දේව සැලැස්ම ඔස්සේ ගමන් කල ඉශ්‍රායෙල් ජනතාව සමඟ දෙවියන් වහන්සේ වැඩ සිටිමින් ඔවුන්ට ශක්තියක් බලයක් වූ ආකාරය නිදසුන් පහක් ඇසුරින් පැහැදිලි කරන්න.

ii. ඉශ්‍රායෙල් ජනයා සීනයි ගිවිසුම තුළින් ලද කැඳවීම. නූතන කිතුනුවාටද, ප්‍රසාද ස්නාපනීය කැඳවීම තුළින් හිමි වේ. කරුණු පහක් ඇසුරින් සනාථ කරන්න.

(ලකුණු 10 x 2 = 20)

08\. i. පහත සඳහන් මාතෘකාවලින් දෙකක් තෝරාගෙන විස්තර සපයන්න.
(එක් මාතෘකාවකට වචන සියයක් සෑහේ.)

i. ජුදා පාස්කුව
ii. ආදිපිතෘ ජාකොබ්ගේ කැඳවීම හා ගිවිසුම
iii. වසංගත දසය
iv. ද්විතිය නීති සම්ප්‍රදාය
v. පලස්තීනයේ භූගෝලීය කලාප (ලකුණු 10 x 2 = 20)

# දෙවන වාර පරීක්ෂණය - 2018
# ක්‍රිස්තියානි ධර්මය - 12 ශ්‍රේණිය.
# I පත්‍රය
# පිළිතුරු

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. | 3 | 11. | 4 | 21. | 1 | 31. | 4 | 41. | 3 |
| 2. | 2 | 12. | 3 | 22. | 4 | 32. | 1 | 42. | 1 |
| 3. | 1 | 13. | 5 | 23. | 5 | 33. | 2 | 43. | 3 |
| 4. | 2 | 14. | 1 | 24. | 2 | 34. | 5 | 44. | 2 |
| 5. | 1 | 15. | 2 | 25. | 5 | 35. | 4 | 45. | 4 |
| 6. | 4 | 16. | 4 | 26. | 3 | 36. | 3 | 46. | 5 |
| 7. | 5 | 17. | 3 | 27. | 2 | 37. | 4 | 47. | 2 |
| 8. | 1 | 18. | 5 | 28. | 1 | 38. | 2 | 48. | 1 |
| 9. | 5 | 19. | 4 | 29. | 4 | 39. | 5 | 49. | 4 |
| 10. | 2 | 20. | 5 | 30. | 3 | 40. | 1 | 50. | 5 |

(ලකුණු 1X2=100)

# ක්‍රිස්තියානි ධර්මය - 12 ශ්‍රේණිය.
# II පත්‍රය
## I කොටස

01. i. සංස්කෘතික වශයෙන් දියුණු වීම.
එඬේර ජීවිත ක්‍රමයට පුහුණු වීම.
සතුරු උවදුරුවලින් ආරක්ෂා වීම.
ගෝත්‍රික සාමය ඇති කිරිම.
ටිකින් ටික දැහැමි ජනතාවක් බවට පත්වීම. (පිටු අංක 51)

ii. නුමුහුන් පූප භාවිතය
තිත්ත පලා අනුභවය
පාස්කු බැටළුවා භෝජනයට ගැනීම.
මිදියුෂ පානය (පිටු අංක 58)

iii. විධායක නීති පද්ධතියකි.
නිශේධාත්මක නීති 08 කි.
ප්‍රතිශේධාත්මක නීති 02 කි.
සර්වකාලීන නීති පද්ධතියකි.
දෙවි - මිනිස් සහ මිනිස් - මිනිස් සබඳතාවය ගොඩනැගීමට දායක වෙයි. (පිටු අංක 66)

iv. දේව දර්ශනය හෝ විශේෂ අත්දැකීම.
දූත මෙහෙවර පැවරීම.
කැඳවීම භාර ගැනීමට දිවැසිවරයා මැලි වීම.
දෙවියන් වහන්සේ විසින් දිවැසිවරයා ධෛර්යවත් කරනු ලැබීම. (පිටු අංක 71,72)

v. ජෝබ්, ගීතාවලිය, ධර්මදේශකයා, උපදේශකයා / සිරාක්, ප්‍රේම ගී, සලමොන්ගේ ප්‍රඥාව, හිතෝපදේශය
(පිටු අංක 79)

02. i. තමා වඩා ප්‍රිය කළ භාර්යාවගේ පුත්‍රයා වීම.
සිය මහලු වියේ ලද පුත්‍රයා වීම.
සහෝදරයන් ගැන සොයා බැලීම
දෙවියන් වහන්සේගේ විශේෂ බැල්මක් ජෝසප්ට ඇති බව ජාකොබ්ට පෙනී යාම. (පිටු අංක 50)

ii. ජොහාන් සුබාරංචිය
1 ජොහාන් 2 ජොහාන් 3 ජොහාන් එළිදරව්ව (පිටු අංක 23)

iii. ටමෙරික්ස් මනිෆෙරා නම් ශාක විශේෂයකින් වැහෙන ශ්‍රාවයකි. එම ගස්වල ළපටි කිනිති වල සාරය උරා බොන කුඩා සතුන් තුවාල කිරීම නිසා ශාකයෙන් නිකුත් කරනු ලබන මිහිරි රසැති ශ්‍රාවයකි.
සුදු පැහැතිය.
මිහිරි රසයෙන් යුක්තය.
කොත්තමල්ලි ඇට තරම් වේ.
ඉර නැග ඒමත් සමඟ දියවී යයි.
මෙම ශ්‍රාවය වියලී ගොස් කබොල්ලක් පමණක් ඉතිරි වේ. (පිටු අංක 60,61)

iv. අසිරිමත් උපදේශකයාණෝ, ප්‍රතාපවත් දෙවිතුමාණෝ, සදාතන පියාණෝ, සාමයේ කුමාරයාණෝ
(පිටු අංක 69)

v. ප්‍රශංසා ගීත, විලාපි ගීත, තුති දීමේ ගීත, ප්‍රඥ ගීත, රාජකීය ගීත, වන්දනා ගීත / සියොන් ගීත , විශ්වාසයේ ගීත
(පිටු අංක 82)

03. i. රතු මුහුද අසලදී පාරාවෝ හා මිසර හමුදාව ලුහුබැඳ එන බව දුටු විට
මාරා නැමති ස්ථානයේදී ජලය තිබුණද එය බීමට නොහැකි වූ විට
සීන් කාන්තාරයෙහි කුසගිනි වූ විට
මස්සා හා මෙරීබා (රෙපිඩීම්) ස්ථානයේදී ජලය හිඟ වූ විට (පිටු අංක 60)

ii. එලියා, එලීෂා, නාතාන්, හුල්දා, අසියා (පිටු අංක 67)

iii. ප්‍රඥාව ලැබීම, නුවන ලැබීම, අනුශාසනා බුද්ධිය ලැබීම, බලය ලැබීම, දැන ගැනීම ලැබීම, දේව ගරු බිය ලැබීම
(පිටු අංක 70)

iv. පවුල හා ශ්‍රෝත්‍රික ප්‍රඥාව
රාජ්‍ය සභාව හා ප්‍රඥාව
අභිධාර්මික ප්‍රඥාව
එදිනෙදා ජීවිතය සම්බන්ධ ප්‍රඥා ආකල්ප (පිටු අංක 79,80)

v. ප්‍රස්ථා පිරුළු, උපදේශ, කියමන්, උපමා, උපමාලංකාර, කතන්දර, ගීත, රූපාලංකාර, සංවාද (පිටු අංක 80)

**(ලකුණු 4 x 5 = 20)**

## II කොටස

04. i. මෝසෙස් තුමා ලද කැඳවීම පිළිබඳ අධ්‍යයනයේදී දිවැසිවරුන් දිවැසිවර පණිවඩ ඉදිරිපත් කිරීමේදී භාවිත කළ වාග් මාලා තුනෙන් එකක් වන 'සමිඳාණන් වහන්සේගේ පණිවිඩය මේය' යන ව්‍යවහාරය මෝසෙස් තුමා භාවිතා කර ඇත. එම කැඳවීම තුල දිවැසිවර කැඳවීමක ලක්ෂණ ඇත.

1. දේව දර්ශනය (නික්මයාම 3, 1- 6)
2. දෙවිඳුන් දූතික සේවාව ඉදිරිපත් කිරීම. (නික්මයාම 3,7 - 10)
3. කැඳවීම භාර ගැනීමට මෝසෙස්තුමා මැලිවීම (නික්මයාම 3,11/3,13/4,1/4,10/4,13)
4. දෙවියන් වහන්සේ විසින් දිරිමත් කරනු ලැබීම. (නික්මයාම 3,12/3,14/4,2-9/4,11-12/4,14)
5. යවනු ලැබීම (නික්මයාම 4,17) අවස්ථා 05 දී ම දිරිමත් කිරීම. (පිටු අංක 53,54 )

ii. සමවයස් කණ්ඩායම් වල ඇති වැරදි ඇබ්බැහිම් වලින් මිදීම හා එවන් අයට නිවැරදි දෙය පැහැදිලි කර දීම.
මත්ද්‍රව්‍ය වලින් වැලකීම, පිටුදැකීම.
අන්තර්ජාලය නිසි ලෙස භාවිතා කිරීම.
සමවයස් කණ්ඩායම්වල වැරදි අඩුපාඩු වලින් වැලකී සිටීම හා ඒ වා ඔවුන්ට පෙන්වාදීම.
අභියෝග වලදී දේව වචනය හමුවේ පිළිතුරු සෙවීම.
අවවාදයට වඩා ආර්ශයෙන් ජීවිතය ජයගැනීමට අන් අයට මඟපෙන්වීම.
ජේසුස් වහන්සේ තම ස්වාමියා කර ගැනීම.
(මේ ආදී කරුණු ඇසුරින් විස්තර කර ඇත්නම් ලකුනු ලබා දෙන්න.) **(ලකුණු 4 x 5 = 20)**

05. i. දෙවියන් වහන්සේ හා මනුෂ්‍ය අතර තිබූ සබඳතාවය බිඳ වැටීම නිසා, මිනිසා පාපයට වැටීම, ඒ ඔස්සේ අයහපත් ප්‍රතිඵල ඇති වීම.
මිනිසා සහ ස්ත්‍රිය යක්ෂයා විසින් පාපයට නතු කර ගත් නිසා ඔවුන්ගේ ඇස් පාපයට හමුවේ අන්ධ වී, පාපයට වැටිණ.
මිනිසා හා භූමිය හෙවත් ස්වභාව ධර්මය අතර තිබූ සම්බන්ධතාවය බිඳවැටීම නිසා මිනිසා දහඩිය හෙලමින්, පොළොව කොට මහන්සි වී එලදාව ලබා ගැනීමට සිදු විය.
ආශිර්වාදයක් වීමට තිබූ දරු ප්‍රසූතිය වේදනාවක් වීම.
දෙවියන් වහන්සේගේ පාලනය යටතේ හැදි වැඩුනු මිනිසා හා ස්ත්‍රියගේ සම්පූර්ණ පාලනය මිනිසාට පැවරීය ස්ත්‍රීය පුරුෂයාගේ පාලනයට යටත් වෙයි.
සරුසාරවත් ලෙස වර්ධනය වූ පොළව නිස්සා විය. භූමිය කාන්තාර පරිසර තත්වයක් කරා පැමිණ නිසරු වී ඇත. එය මැවීමට පෙර තිබුණු ස්වභාවයට නැවත යාමත් වැනිය. ( පිටු අංක 34,35)

ii. ආදම් හා ඒව සියලු ආකාර දැනීම හිමි කර ගැනීමට යන්න දැරීම එහෙත් සදාචාර පැවැත්මේ ආධිපත්‍ය දෙවියන් වහන්සේ සතු දෙයකි.
කායින් විසින් ආබෙල් පිළිබඳ තිබූ වෛරය නිසා කායින් තම සහෝදරයාට මරා දැමුවේය. නමුදු ජීවිතය අයිති දෙවියන් වහන්සේටය.
මිනිසුන් - දූවරු දිව්‍ය පුත්‍රයන් සමඟ සංවාසයේ යොදමින් අමරණීයතාව ලබා ගැනීමට උත්සාහ කළහ. එහෙත් දෙවියන් වහන්සේ පමණක් අමරණීය වන සේක.
බාබෙල් කොත සිදුවීම තුළින් දෙවියන් වහන්සේගේ වාසභවනය මිනිසා සතු කර ගැනීමට යන්න දැරිය. නමුත් එහි සැබෑ උරුමකරු දෙවියන් වහන්සේය. මිනිසා උන්වහන්ගේ මැවිල්ලක් පමණි. (මෙවැනි කරුණු ඇසුරින් විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.) **(ලකුණු 4 x 5 = 20)**

06. i. **ඒකදේවවාදයඃ-**
ඒකදේව වාදය නැතහොත් එකම වූ දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය පුරාණ ගිවිසුමේ දිවැසිවරුන්ගේ ප්‍රධාන ඉගැන්වීමකි. ඔවුන්ට අනුව වැඩ සිටින්නේ එකම දෙවි කෙනෙකු පමණි. අන් සියළු දෙවිවරු, මැටි, ගල් ලී යනාදියෙන් කරන ලද මිනිස් නිර්මාන පමණි.

**සදාචාරයඃ-**
ඉශ්‍රායෙල් ජනතාව නීතිගරුක, යුක්ති ගරුක හා ශිෂ්ඨ සම්පන්න ජනතාවක් බවට පත්වූයේ සීනායි ගිවිසුම තුලය. එසේ නම් ඔවුන් තුළ ශීල ධර්මය හා සදාචාරය ගොඩනැගීමට දස පනත බෙහෙවින් පිටිවහලක් වූවාට සැක නැත. දිවැසිවරුන්ද ඉශ්‍රායෙල් ජනතාව හැඳින්වූයේ ගිවිසුම් ජනතාවක් ලෙසය. විශ්වාසවන්තකම, කරුණාව, ස්ථිර ප්‍රේමය ගිවිසුම් සම්බන්ධතාව පෙන්නුම් කරයි.

**මෙසියානු සංකල්පයඃ-**

ජුදා ජනතාවගේ බලාපොරොත්තු වන කේන්ද්‍රය වූයේ මෙසියස් වහන්සේය. හෙබ්‍රෙව් බසින් 'මෂියාහ්' ග්‍රීක බසින් 'ක්‍රිස්ටොස්' ලෙසද, මෙසියස් වහන්සේව හඳුවන්වයි. එහි අර්ථය 'අලේප කරනු ලැබූ තැනැත්තා' යන්නයි. පළමුවන මෙසියානික දිවැස් වැකිය නානාත් දිවැසිවරයා දාවිත් රජුට ප්‍රකාශ කරයි. (පිටුව 68)

ii. ලොව මැවුම්කාර දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය ඇති කිරීමට යාච්ඤාවට පෙළඹවීම.
කිතුනු ආගමික නායකයන්ගේ ඇසුර ලබා දීම.
බහුදේව වාදී ඇසුරට යොමු වී ඇති මිතුරා වෙනුවෙන් යාච්ඤා කිරීම.
බහුදේවවාදී ඇදහිලිවල යතාර්ථය පැහැදිලි කිරිම.
දිවය පූජාවේ ඇති බලවත්කම ඔහුට අවබෝධකර දීම හා සක්‍රමේන්තු ජීවිතයට ඔහුව යොමු කිරීම.
(මෙවන් කරුනු ඇසුරින් ලියා ඇත්නම් ලකුනු ලබාදෙන්න.) **(ලකුණ 4 x 5 = 20)**

07. i. වළා ටැඹ හා ගිනිටැඹ

දෙවියන් වහසන්ස් ඉශ්‍රායෙල් ජනයා සමඟ වැඩසිටීමේ සලකුණක් ලෙස ද, මඟපෙන්වීමේ සලකුණක් ලෙසද දිවා කාලයට වලා ටැඹක් හා රාත්‍රී කාලයට ගිනිටැඹක් ලෙසින් ඔවුන්ට පෙරටුව ගිය සේක.
මාරා නැමති ස්ථානයයේදී පිපාසා වීම.

මුහුදින් එතෙර වූ ජනයා දින 03 ක් පාළුකරයේ ගමන් කළ ද ජලය නොලැබුණි. 'මාරා' යන්නෙහි අර්ථය 'තිත්ත' යනුයි. බීමට අපහසු ජලය මිහිර බවට පත් කරන ලද්දේ දේව මැදිහත්කමෙන් ශාරීරික අවශ්‍යතාවයක් ලෙස ඔවුන් ශක්තිමදත් කළ සේක.
සීන් කාන්තාරයේ දී ආහාර සැපයීම.

ආහාර හිඟ වූ විට ඉශ්‍රායෙල් ජනයා මොසෙස්තුමාටත්, දෙවියන් වහන්සේටත්, විරුද්ධ ව කොඳුලෝය. ඔවුන්ගේ මැසිවිලි හඬට කන්දුන් දෙවියන් වහන්සේට ඔවුනට ආහාර සඳහා මන්නා හා වටුවන් ලබා දුන් සේක. ඉශ්‍රායෙල් ජනයාගේ අවිශ්වාසය මධ්‍යයේ පවා දෙවිදුන් ඔවුන් ශාරීරිකව ශක්තිමත් කළ සේක.
ලෝකඩ සර්පයා

පාළුකරණයේ දී ඉශ්‍රායෙල් ජනයා බොහෝ සේ අධෛර්ය පත්ව අසරණ වී සිටියහ. ඔවුහු නැවතත් දෙවියන් වහන්සේට සහ මෝසෙස් තුමාට විරුද්ධව අවලාද කියන්නට විය. එවිට සමිදාණන් වහන්සේ සෙනඟ මැදට විසකුරු සර්පයන් එවුයෙන් එම සර්පයෝ ඔවුනට දෂ්ට කරන්නට වූහ. ඉශ්‍රායෙල් සෙනඟ අතරින් බොහෝ දෙනා මරණයට පත්වූහ. අසරණව අධෛර්යමත්ව සිටින ජනතාව මෙසේ ශක්තිමත් කළ අතර ඔවුන්ට එල්ල වූ ආක්‍රමණවලින් ද ජය ගැනීමට දෙවියන් වහන්සේ ඔවුන් ශක්තිමත් කළ සේක. (පිටු 60,61,62)

ii. ගිවිසුමක් යනු දෙපාර්ශවයක් අතර ඇතිවන කොන්දේසි මත පිහිටන සබඳතාවයකි. කොන්දේසි සුරැකීම පිනිස දෙව් කෙනෙකු සාක්ෂි දැරීම කල යුතුය.
එබැවින් සීනාසී ගිවිසුම තුළින් දෙවියන් වහන්සේ සමඟ ඇති කරගත් සම්බන්ධතාවය ත්‍රිවිධාකාර්‍යයන් හිමිවේ. එනම්, එඬේරික, පූජක දිවැසිවර වේ.
මෙම ත්‍රිවිධ කාර්යන්ට අනුව ප්‍රසාද ස්නාපනය ලැබූ කිතුනුව, ද ජීවත් විය යුතුය.
ජේසුස් වහන්සේගේ සුපුවන ලොවට දේශනා කිරීමේත් ප්‍රසාද ස්නාපනීය වගකීම් ක්‍රියාත්මක කිරීමට හැකිවීම.
එමෙන්න දේව හඬට ඇහුම්කන්දී, දෙවියන් වහන්සේ හා විසිනා අතර මැදිහත්කාරයෙකු වීම.
කිතුනුවා දෙවියන් වහන්සේට අයිති සම්පතකි. ඔහු /ඇයි අන් අය වෙනුවෙන් දෙවිදුන් ඉදිරියේ මැදිහත්කරුවෙකි.
කිතුනුවාව විශේෂ දූත සේවාවක් සඳහා එදා ඉශ්‍රායෙලුන් වෙන් වෙන් කර ඇත. (පිටුව 63,64)

08. i. **ජුදා පාස්කුව :-**

පාස්කු මංගල්‍ය පිළිවෙතහි අන්තර්ගත ප්‍රධාන අංග දෙකකි. 01. පාස්කු බැටළුවා සම්බන්ධ පිළිවෙත. 02. නුමුහුන් පූප සම්බන්ධ පිළිවෙත.

**පාස්කු බැටළුවා සම්බන්ධ පිළිවෙත**

එඬේරුන්ට හේවමන්තය දුෂ්කරය. මන්ද තම බැටළු රැලට ආහාර සපයා ගැනීමට තිබූ අපහසුතාවයි. එමෙන්ම හේමන්තයෙන් පසුව උදාවන වසන්තය ඍතුව නිසා අවට පරිසරය වෙනස් වේ. එබැවින් එඬේරු නව තෘණ බිම් කරා සංක්‍රමණය කරයි. මෙසේ යාමට පෙර දේව ආරාක්ෂාව පතා රැළෙන් අගනා බැටළුවකු මරා උගේ ලෙය කූඩාරමේ ඉදිරිපස තිබූ තැවරීම සිරිතකි. නිසාන් මස 14 වන දින රාත්‍රියේ මෙම පිළිවෙත සිදු කරයි.

**නුමුහුන් පූප සම්බන්ධ පිළිවෙතඃ-**

මෙම පිළිවෙත කෘෂිකාර්මික යුගයේ සිට පැවතුණි. ගොවින් තමන් ලද සරුසාර අස්වැන්න වෙනුවෙන් දෙවියන්ට තුති පිදූහ. 'නුමුහුන් පූප' සඳහා හෙබ්‍රෙව් වචනය 'මට්ෂාහ්' යන්නයි.
ඉශ්‍රායෙල් ජනයා වසරක් පාසා මෙම සිද්ධිය අනුමස්මරණය කළහ.
එය පැරණි ගිවිසුමේ පාස්කුව විය.
මෙම පිළිවෙතට සහභාගී විය හැකි වූයේ චර්මච්ඡේදිත අයට පමණි.

ඉශ්‍රායෙල්වරුන් මෙම පිළිවෙත වෙනත් අර්ථයක් ගැනිණි. මිසරයෙන් නික්මයන රාත්‍රියේ කඩිමුඩියේ යන නිසා පූප වලට මුහුන් එක් කිරීමට නොහැකියි. එම නිසා නුමුහුන් පූප අනුභව කිරීමට සිදුවිය.
පාස්කු මංගල්‍යයට කුළුදුලන් සම්බන්ධ පිළිවෙතද එක් කර ඇත. (ලකුණු 10) (පිටු අංක 56 - 58)

ii. ජාකොබ් තුමා කපටි පුද්ගලයෙක් විය. තම සොයුරු එසව්ටට වඩා ක්‍රියාශීලී විය. තම පියාණන් වූ වහලු ඊසාක් රවටා වැඩිමහල් දරුවාට අයත් වූ ආශිර්වාදය ලබාගත් සැටි උත්පත්ති පොතෙහි සඳහන් වෙයි. එපමණක් ද වැඩිමලා වූ එනම් සිය ජන්ම උරුමය ජාකොබ්ට විකුණුහ. ජාකොබ් ගෙදරින් පලා ගිහය. තම මැනියන්ගේ උපදෙස් අනුව හාරාන්හි තම මාමා වූ ලාබන් වෙත ජාකොබ් පලා ගියහ. ජාකොබ්ට විශාල දරු සම්පතක් විය. එම දරුවන් ගණන දොළොසක් විය. එම දරුවන්ගේ ජාකොබ් වඩා ප්‍රිය කළ දරුවා වූයේ ජොසප් ය. එයට පහත කරුනු බලපෑමය.

1. ජාකොබ් වඩාත්ම ප්‍රිය කල භාර්යාව වන රාකෙල්ගේ පුත්‍රයා ජොසෙප් වීම.
2. සිය මහලු වියේදී ලද පුත්‍රයා වීම.
3. සොයුන් ගැන සයො බැලීම.
4. දෙවියන් වහන්සේගේ විශේෂ බැල්මක් ජොසෙප්ට ඇති බව ජාකොබ්ට පෙනීයාම.
5. ජාකොබ්ගේ කැදමවී හා ඇති කරගත් ගිවිසුම

බෙහෙල් නැමැති ස්ථානයේදී ජාකොබ්තුමා පුදුම සිහිනයක් දුටුවේය. ජාකොබ්තුමා එහිදී තම දේව සැලැස්ම තේරුම් ගත්තේය. ආබ්‍රහම් සමග දෙවියන් වහන්සේ කළ ගිවිසුම ජාකොබ් මගින් අලුත් කළේය. ජාකොබ් එහිදී කැඳවීමක් ද ලැබිය. එම කැඳවීමේ පොරොන්දු 02 කි. (පිටු 49 - 50) (ලකුණු 10)

iii. වසංගත දසය

පාරාවෝ හා මිසර වාසීන් මත පීඩා බලපෑවද, ඉශ්‍රායෙල් ජනයා වෙත නොවීය. ඒ අනුව මෙය දේව හස්තයේ ක්‍රියාවකි. පරාවෝ හා මිසර වාසිහු දෙවිඳුන්ගේ සතුරන් ලෙස ක්‍රියාකිරීමත්, මිසරයේ බලය පරාජයට කිරීමත් ඇරුත් ගන්වයි.

1. වතුර ලේ වීම 2. මැඩි උවදුරු 3. කිනිතුලු උවදුර 4. මැසි උවදුර 5. ගව සම්පත් වැනසීම.
6. ගඩු උවදුර 7. ගල් වර්ෂාව 8. පළගැටි උවදුර 9. ගනඳුරු උවදුර 10. කුළුඳුලන්ගේ මරණය

පීඩා 10 පූජක, යාමේ එලොහිම් සම්ප්‍රදායන්ගේ සංකලනයෙන් ගොඩ නැගුණකි.

පරමාර්ථය දෙවිඳුන්ගේ ආධිපත්‍ය පාරාවෝ හා මිසර වැසියන්ට ප්‍රකාශ කිරීමත්, ඔවුන් දෙවියන්ගේ අධිරාජ්‍යය පිළිගැනීමට සැලැස්වීමක් එමගින් ඉශ්‍රායෙල්වරුන්ට නික්මයාමට හැකිවීමත්ය.

වසංගත 10 සැලැස්ම.

පීඩා 10 සංසන්දනය කිරීමේදී මේවාට පොදු සැලැස්මක් දැකිය හැකිය. වසංගත ගොඩනගා ඇති ආකාරය තුළ ත්‍රිවිධ සැලැස්මක් ඇත. ත්‍රිවිධ සැලැස්ම

1. 4.7 2. 5.8 3. 6.9

මේ පීඩා ක්‍රමයෙන් උච්චස්ථානය කරා ගොඩනැගී ඇත. එය අදියර 03 කි.

01. ජලය ලේ වීම. 02. කිනිතුලු උවදුර 03. ............................

මේ වසංගත ස්වභාව ධර්මයේ සිදුවීම් වුවද සිදු කරන අවස්ථාව අනුව දේව හස්තයේ ක්‍රියාවන්ය.

(පිටු 55 - 56) (ලකුණු 10)

iv. ද්විතිය නිති සම්ප්‍රදාය (D)

ක්‍රි.පූ. 722 දී උතුරු රාජ්‍යය ආසිරියාව ආක්‍රමණය කිරීමත් සමග ම, දකුණු රාජ්‍යයට පලාගිය ලෙවීවරුන් ඔවුන් සතු වූ ද්විතීය නීති දකුණට රැගෙන පැමිණියද ඒවා ජුදහි රජකම් කළ මනස්සේගේ කාලයේදී (ක්‍රි.පූ, 689 - 641) යටපත් වී හෝ නැති වී නැවත හමුවුයේ ක්‍රි.පූ. 621 දී පමන ජොෂියා රජ සමයේ දී (ක්‍රි.පූ. 639 - 609) ජෙරුසලම් දේව මන්දිරයේදීය. ජොෂියා රජතුමා මෙම සම්ප්‍රදාය අනුව මනස්සේ යටතේ පරිහානියට පත් වූ ජුදා රාජ්‍යය ජාතික හා ආගමික වහයෙන් ප්‍රතිසංස්කරණය කරන ලදී. ජොෂියා රජතුමාගේ කාලයේදී මෙම සම්ප්‍රදාය වොසෙස් තුමාගේ දේශනා තුනක රාමුවකට සකස් වූ බව විශාරද මතයයි.

අනුශාසනාත්මතය, එකම දේ නැව නැවත කියයි. ඉශ්‍රායෙලුන් ගිවිසුමකින් පිටු පෑම නැවත වරක් විප්‍රනාසගත වීමට හේතුවයි. නීතිය පිළිපැදීම දේව වන්දනාවකි. එක් දෙවි කෙනෙක්, එක දේව මාලිගාවක්, එක රාජ්‍යක්, යන්නට විශේෂ අවධානයක් දී ඇත. (පිටු අංක 22 - 23) (ලකුණු 10)

v. **පලස්තිනයේ භූගෝලීය කලාප**

පලස්තීනයේ භෞතික ව්‍යුහය විශාල විෂමතාවක් පෙන්නුම් කරයි. එහි බටහිර සිට නැගෙහිරට ස්වභාවික තීරු හතරක් උතුරේ සිට දකුණට දිව යයි.

01. වෙරළබට තීරුව 02. බටහිර කඳු 03. ජෝර්දාන් මිටියාවත 04. නැගෙනහිර කඳු

**වෙරළබඩ තීරුව**

මෙය මිටියාවත් තුනකින් සමන්විතය.

අක්කෝ මිටියාවත :- මෙම මිටියාවත කාර්මෙල් කඳු පාමුල සිට අක්කෝ වරාය වටේ ඇති තැනිතලාව ඔස්සේ ගිනිෂියාව ද පසුකර සැතපුම් 20 ක් පමණ උතුරට විහිදෙයි.

**ෂාරොන් මිටියාවත :-** මෙම මිටියාවත කාර්මෙල් කන්දෙන් දකුණු දෙසට විහිදී යන්නා වූ බිම් ප්‍රදෙසකි. එය ජොප්පාවේ සිට කයිසාරිය දක්වා විහිදෙයි.

**පිලිස්ති මිටියාවත :-** පිලිස්ති මිටියාවත ජොප්පාවට සැතපුම් පහක් පමණ දකුණින් පටන් ගන්නා අතර එය දකුණු දෙසට සැතපුම්70 ක් පමන දුරට විහිදෙයි. බෙයර්ෂෙබා නම් ස්ථානයේ දී එය සැතපුම් 25 ක් පමණ පළල් ය.

**බටහිර කඳු :-** පලස්තිනයේ කොඳු නාරටිය බඳුය. මෙම කදුවැටිය එස්ඩ්‍රාලොන් තැනිතලාව නිසා දෙකඩ වේ. මෙම නිම්නය හරහා කිෂොන් ගංගාව ගලා බසියි. මෙම කඳු කොටස් හතරකට බෙදිය හැකිය. එනම් ගලීල කඳුකරය, සමාජීයාවේ මදයම කදුකරය, ජුදා කදුකරය හා නෙගෙබිය.

ගලීල කඳුකරය:- ගලීල කඳුකරය ප්‍රධාන කොටස් 02 කි. එනම් උතුරු හෙවත් ඉහළ ගලීලය හා දකුණු හෙවත් පහළ ගලීල යනුයි.

**සමාරියාවේ මධ්‍යම කඳුකරය :-** මෙම කඳුකරය එප්‍රායිම් කන්දේ සිට එස්ඩ්‍රාලෙන් තැනිතලාව දක්වා විහිදෙයි. බෙතෙල්, ෂිලෝ හා ෂෙකෙම් යන ශුද්ධාස්ථාන මෙහි පිහිටියේය.

**ජුදා කඳුකරය:-** භූමියෙන් වැඩි ප්‍රමාණයක් නිසරුය. නැගෙනහිර ප්‍රදේශය පාළුකරය වේ. මුහුදු මට්ටමින් අඩි 3,040 ක් උසින් පිහිටි හෙබ්‍රොන් පලස්තීනයෙහි ඇති උසම නගරයයි.

**නෙගෙබ්**

නිසරු හා කඳුකර බිමක් වන මෙහි හැකි ස්ථානයන් හි ගොවිතැන හා සත්ත්ව පාලනය සිදු කෙරෙයි. මෙහි වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර 15 ත් වඩා අඩුය. නෙගෙබ් යන්නෙහි අර්ථය 'වියළි' යන්නයි.

**ජොර්දානයෙන් එපිට නැගෙනර කඳු**

මෙම කඳු ජොර්දාන් නිම්නය හා සිරියානු කාන්තාරය අතර පිහිටියේ ය. හර්මෝන් කන්දේ සිට මල මුහුදේ දකුණ සීමාව දක්වා සැතපුම් 150 ක් පමණ දුරට පමණ දුරට මෙම කඳු වැටිය විහිදෙයි. එහි පළල සැතපුම් 30 - 80 වේ. කන්දේ සමාන්‍ය උඩ අඩි 2,000 කි. දේශගුණය සෞම්‍ය ය. ඕක් වනාන්තරවිල්න යුක්තය. මෙම කඳුවලින් ආරම්භ වන යාර්මාක් හා ජබොක් ගංගා ජෝර්දාන් ගඟට ද, අර්නොත් හා සෙරෙද් ගංගා මළ මුහුදට ද ගලා බසියි.

**ජොර්දාන් මිටියාවත**

බටහිර කඳු හා නැගෙනහිර කඳු අතර ගිලා බැස ඇති භූමි ප්‍රදේශයක පිහිටියේ ය. මෙම මිටියාවත හරාහ ජෝර්දාන් ගඟ ගලා බසියි. මෙම ගඟෙහි ආරම්භය ලෙබනන් කඳු වලිනි. (පිටු අංක 6 - 8) (ලකුණු 10)